ජිනපඤ්ජර ගාථා රත්නය

Jinapanjara Gatha & Meaning

ජිනපඤ්ජර ගාථා (Pali)	සිංහල තේරුම (Sinhala)
ජයාසන ගතා වීරා	ජය අසුන් අරා වැඩහුන් වීර වූ
ජෙත්වා මාරං සවාහිණිං,	සේනා සහිත මරසෙන් පරදවා,
චතුසච්චාමතරසං, යේ පිවිංසු නරාසභා	යම් නරෝත්තමයන් වහන්සේලා සිවුසස් අමා රසය පානය කොට වදාළ සේක් ද,
තණ්හංකරාදයෝ බුද්ධා,	තණ්හංකරාදි ඒ බුදුවරයෝ ද,
අට්ඨවීසති නායකා,	අටවිසි ලෝක නායකයන් වහන්සේලා ද,
සබ්බේ පතිට්ඨිතා (තුය්හං) මත්ථකේ (තේ) මුනිස්සරා	ඒ සියලු මුනීශ්වරයන් වහන්සේලා (ඔබේ) මස්තකයෙහි (හිස මත) වැඩ වසන සේක.
සිරේ පතිට්ඨිතා බුද්ධා,	(ඔබේ) සිරසෙහි බුදුවරු වැඩ වෙසෙති.
ධම්මෝ ච	ධර්මය ද
(තව) ලොචනේ,	(ඔබේ) දෑසෙහි පිහිටියේ ය.
සංඝෝ පතිට්ඨිතෝ (තුය්හං)	(ඔබේ) මහ සඟරුවන පිහිටියාහු ය.
උරේ සබ්බ ගුණාකරෝ	සියලු ගුණයට ආකරයක් වූ, ලයෙහි වෙසෙයි.
හදයේ අනුරුද්ධෝ ච,	හදවතේ අනුරුද්ධ තෙරුණුවෝ ද
සාරිපුත්තෝ ච දක්ඛිණේ	දකුණුපස සැරියුත් තෙරුණුවෝ ද
කොණ්ඩඤ්ඤෝ පිට්ඨිභාගස්මිං	පසුභාගයෙහි කොණ්ඩඤ්ඤ තෙරුණුවෝ ද
මොග්ගල්ලානොසි වාමකේ	වම්පස මුගලන් තෙරුණුවෝ ද වෙති.
දක්ඛිණේ සවණෙ (තුය්හං)	ඔබගේ දකුණු කණෙහි
ආහුං ආනන්ද රාහුලා	ආනන්ද සහ රාහුල තෙරවරු ද
කස්සපෝ ච mහානාමෝ,	කාශ්‍යප සහ මහානාම තෙරුන් වහන්සේලා ද
උභොසුං වාමසෝතකේ	ඒ උභය දෙනා වහන්සේලා වාම ශ්‍රෝතසයෙහි (වම් කණෙහි) වසන සේක.
කෙසන්තේ පිට්ඨිභාගස්මිං,	කේශාන්තයේ හා පසුභාගයෙහි

ජිනපඤ්ජර ගාථා (Pali)	සිංහල තේරුම (Sinhala)
සුරියෝව්ය පහංකරෝ	හිරුමෙන් බබළන
නිසින්නෝ සිරිසම්පන්නෝ	සමෘද්ධි සම්පන්නව වැඩ වෙසෙයි
සෝහිතො මුනි පුංගවො	සෝභිත නම් මුනි උතුමාණෝ පිහිටිය හ.
කුමාර කස්සපෝ නාම	කුමාර කාශ්‍යප නම් වූ
මහේසි චිත්‍රවාදකෝ	විචිත්‍ර කථික වූ ඒ මහා ඍෂින් වහන්සේ
සො (තුය්හං) වදනේ නිච්චං,	ඔහු ඔබගේ මුහුනෙහි (මුවෙහි) uිතර
පතිට්ඨාසි ගුණාකරෝ	ගුණයන්ට ආකර වූ උන්වහන්සේ පිහිටි සේක.
පුණ්ණෝ අංගුලිමාලෝච	පුණ්ණ, අංගුලිමාල ද
උපාලී නන්ද සීවලී	උපාලි, නන්ද, සීවලී ද යන
ථේරා පඤ්ච ඉමේ ජාතා	මේ පස්තෙරුන් වහන්සේලා
ලලාටේ තිලකා (තව)	ඔබේ නලලෙහි තිලකයක් මෙන් ජාත වූ සේක (වසන සේක).
සෙසාසීති මහාථේරා	සෙසු අසූ මහා ශ්‍රාවක තෙරුන් වහන්සේලා
විජිතා ජිනසාවකා	කෙලෙස් සතුරන් පරදවා ජයලද බුදු සව්වෝ
ජලන්තා සීලතේජේන	සිල් තෙදින් බබලමින්
අංග මංගේසු සණ්ඨිතා	ඔබේ අඟපසඟෙහි පිහිටියාහු ය.
රතනං පුරතෝ ආසී	ඔබේ පෙරටුවේ රතන සූත්‍රය පිහිටියේ ය.
දක්ඛිණේ මෙත්තසුත්තකං	දකුණේ මෙත්ත සූත්‍රය ද
ධජග්ගං පච්ඡතෝ ආසි,	පසුභාගයෙහි ධජග්ග සූත්‍රය ද පිහිටියේ ය,
වාමේ අංගුලිමාලකං	වම් පස අංගුලිමාල සූත්‍රය ද පිහිටියේ ය.
ඛන්ධ මෝර පරිත්තංච	කඳ පිරිත සහ මෝර පිරිත ද
ආටානාටිය සුත්තකං	ආටානාටිය සූත්‍රය ද
ආකාසච්ඡදනං ආසී	ඔබට අහසෙහි සෙවනක් (වියනක්) මෙන් විය,
සේසා පාකාර සඤ්ඤිතා	සෙසු සියලු පිරිත් ඔබ අවට ප්‍රාකාර මෙන්ද පිහිටියාහු ය.

ජිනපඤ්ජර ගාථා (Pali)	සිංහල තේරුම (Sinhala)
ජිනානා බල සංයුත්තේ	තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අණ බෙලෙන් යුතු වූ,
ධම්මපාකාරලංකතේ	ධර්මය නමැති ප්‍රාකාරයෙන් අලංකාර වූ,
වසතෝ තේ චතුකිච්චේන	සිවු ඉරියව්වෙන් වෙසෙන ඔබට,
සදා සම්බුද්ධ පඤ්ජරේ	හැම කල්හි සර්වඥ නමැති ජිනපඤ්ජරයෙහි (බුදුමැදුරෙ)
වාතපිත්තාදි සඤ්ජාතා	වා පිත් ආදියෙන් hට ගන්නා වූද,
බාහිරජ්ඣත්තුපද්දවා	බාහිර වූ හා ආධ්‍යාත්මික වූ ද සියලු උවදුරු,
අසේසා විලයං යන්තු අනන්ත ගුණ තේජසා	අනන්ත ගුණ තෙදින් සර්ව ප්‍රකාරයෙන් (අශේෂයෙන්) දූරිභූත වේවා.
ජිනපඤ්ජර මජ්ඣට්ඨං	ජිනපඤ්ජර මධ්‍යගතව
විහරන්තං mahiතලේ	පොළෝ තලයෙහි වාසය කරණ ඔබ,
සදා පාලෙන්තු (ත්වං) සබ්බේ	හැම කල්හිම ආරක්ෂා කෙරෙත්වා
තේ මහාපුරිසා'සභා	ඒ සියලු මහා පුරුෂෝත්තමයන් වහන්සේලා.
ඉච්චේවමච්චන්ත කතෝ සුරක්ඛෝ	මෙසේ ඒකාන්තයෙන් කරණ ලද මනා ආරක්ෂා ඇතිව,
ජිනානුභාවේන ජිතුපපද්දවෝ	ජිනේන්ද්‍රයන් වහන්සේගේ ආනුභාවයෙන් දිනන ලද උවදුරු ඇතුව,
බුද්ධානුභාවේන හතාරි සංඝෝ	බුද්ධානුභාවයෙන් නසන ලද සතුරු සමූහයා ඇතුව,
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ	සදහම් බලයෙන් ආරක්ෂා කරන ලදුව හැසිරෙන්නේය.
ඉච්චේවමච්චන්ත කතෝ සුරක්ඛෝ	මෙසේ ඒකාන්තයෙන් කරණ ලද මනා ආරක්ෂා ඇතිව,
ජිනානුභාවේන ජිතුපපද්දවෝ	ජිනේන්ද්‍රයන් වහන්සේගේ ආනුභාවයෙන් දිනන ලද උවදුරු ඇතුව,
ධම්මානුභාවේන හතාරි සංඝෝ	ධම්මානුභාවයෙන් නසන ලද සතුරු සමූහයා ඇතුව,
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ	සදහම් බලයෙන් ආරක්ෂා කරන ලදුව හැසිරෙන්නේය.

ජිනපඤ්ජර ගාථා (Pali)	සිංහල තේරුම (Sinhala)
ඉච්චේවමච්චන්ත කතෝ සුරක්ඛෝ	මෙසේ ඒකාන්තයෙන් කරණ ලද මනා ආරක්ෂා ඇතිව,
ජිනානුභාවේන ජිතූපපද්දවෝ	ජිනේන්ද්‍රයන් වහන්සේගේ ආනුභාවයෙන් දිනන ලද උවදුරු ඇතුව,
සංඝසානුභාවේන හතාරි සංඝෝ	සංඝානුභාවයෙන් නසන ලද සතුරු සමූහයා ඇතුව,
චරාහි සද්ධම්මනුභාව පාලිතෝ	සදහම් බලයෙන් ආරක්ෂා කරන ලදුව හැසිරෙන්නේය.
සද්ධම්ම පාකාර පරික්ඛිතොසි	ඔබ සද්ධර්මය නමැති ප්‍රාකාරයෙන් වට කරන ලද්දේ වේ.
අට්ඨාරියා අට්ඨදිසාසු හොන්ති	ආර්යයන් වහන්සේලා අට නම අට දිශාවන්හි වෙති.
එතන්තරේ අට්ඨ නාථා භවන්ති	මේ අතරෙහි අට නාථයෝ (බුදුවරු) වෙති.
උද්ධං විතානං ව ජිනා ඨිතා (තේ)	ඔබට උඩුවියනක් සේ ජිනේන්ද්‍රයන් වහන්සේලා (සියලු බුදුවරු) වැඩ වෙසෙති.
හිඳන්තෝ මාරසෙනං	දස මරසෙන් පරදවමින් (බිඳිමින්)
(තව) සිරසි ඨිතෝ	ඔබගේ සිරසෙහි වැඩ සිටින සේක.
බොධිමාරුය්හ සත්ථා,	ජයසිරි මහ බෝ රුක්මුල විදුරසුන් අරා වැඩහිඳ,
මොග්ගල්ලානොසි වාමේ වසති භූජතටේ දක්ඛිණේ සාරිපුත්තෝ	මහ මුගලන් තෙරුන් වහන්සේ වම් පසෙහි ද, සැරියුත් මහ තෙරුන් වහන්සේ දකුණු පසෙහිද, වසති.
ධම්මෝ මජ්ඣේ urස්මිං විහරති භවතෝ මොක්ඛතෝ මෝර යොනිං	භවයෙන් මිදීම හේතුකොට ගෙන ධර්මය ලය මැද පවතී. මෝරයෝනියට
සම්පත්තෝ බොධිසත්තෝ චරණ යුගගතෝ භාණු ලොකේක නාථෝ	පැමිණියා වූ බෝසතාණන් වහන්සේ ද, හිරුමෙන් ලෝවැසියාට අසහාය සරණ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද පා යුවලට ගිය සේක.
සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං	සියලු අවමඟුල්, උවදුරු සහ නපුරු නිමිති ද
සබ්බීතිරෝග ගහදොසමසේසනින්දා	සියලු රෝග පීඩා, ග්‍රහදෝෂ සහ අශේෂ නින්දා ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං	සියලු අන්තරාය, භය සහ නපුරු සිහින යන මේ සියල්ල
බුද්ධානුභාව පවරේණ පයාතුනාසං	බුද්ධ රත්නයේ උතුම් ආනුභාවයෙන් දුරුවෙත්වා (විනාශයට පත් වේවා).

ජිනපඤ්ජර ගාථා (Pali)	සිංහල තේරුම (Sinhala)
සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං	සියලු අවමඟුල්, උවදුරු සහ නපුරු නිමිති ද
සබ්බීතිරෝග ගහදොසමසේසනින්දා	සියලු රෝග පීඩා, ග්‍රහදෝෂ සහ අශේෂ නින්දා ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං	සියලු අන්තරාය, භය සහ නපුරු සිහින යන මේ සියල්ල
ධම්මානුභාව පවරේණ පයාතුනාසං	ධම්ම රත්නයේ උතුම් ආනුභාවයෙන් දුරුවෙත්වා (විනාශයට පත් වේවා).
සබ්බාවමංගලමුපද්දවදුන්නිමිත්තං	සියලු අවමඟුල්, උවදුරු සහ නපුරු නිමිති ද
සබ්බීතිරෝග ගහදොසමසේසනින්දා	සියලු රෝග පීඩා, ග්‍රහදෝෂ සහ අශේෂ නින්දා ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං	සියලු අන්තරාය, භය සහ නපුරු සිහින යන මේ සියල්ල
සංඝානුභාව පවරේණ පයාතුනාසං	සංඝ රත්නයේ උතුම් ආනුභාවයෙන් දුරුවෙත්වා (විනාශයට පත් වේවා).

This is for informational purposes only. For medical advice or diagnosis, consult a professional. AI responses may include mistakes.